WORKED


# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 11,589 — 1958 නොවැම්බර් 19 වැනි බදාදා — 19.11.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**එන්/ඊ 41 ආහාර මිල නියෝගය** | **අතිරේක ආහාර ද්‍රව්‍ය**

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

**නියෝගය**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිල පාලක තැන්පත් ආතර් කන්බට් බතෝලමියුස් වන මම, 1950 අංක 29 දරණ මිලපාලන පනතේ 4 වැනි වගන්තිය සහ එම පනතේ 3(2) වැනි වගන්තියෙන් මාහට පැවරී තිබෙන බලතල අනුව :—

(1) 1958 අගෝස්තු 15 වැනි දින අංක 11,525 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 අගෝස්තු 10වැනි දින අංක ඇන්/ඊ 39 දරණ ආහාර මිල නියෝගයේ උපලේඛණයන්හි 2 වෙනි තීරයේ සඳහන් අර්තාපල් පිළිබඳව එම උපලේඛණයන්හි 3 වෙනි තීරයන්හි සඳහන් තොග වෙළෙන්දකු විසින් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළද සිල්ලර වෙළෙන්දකු විසින් විකිණිය හැකි වැඩිම සිල්ලර මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛණයන්හි 2 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර හොන්ඩරයක් ද, සිල්ලර වෙළෙන්දකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක් ද එම උපලේඛණයන්හි 1 වෙනි තීරයේ සඳහන් සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිළ මේ දැන් පටන්, මීට යාකර ඇති උපලේඛණයන්හි 3 වෙනි තීරයේ සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) උප ලේඛණයන්හි දෙවෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛණයන්හි 2වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) උපලේඛණයන්හි සඳහන් යම් ද්‍රව්‍යයක් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හෝණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක උපලේඛණයන්හි 2 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උපලේඛණයෙහි 2 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍යය සඳහා— රාත්තල හෙවත් '' රා. '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයිස් බර ක්‍රමය අනුව සම්මත. රාත්තලේ බර බවද, නියම කරමි.

(7) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදෙශයකම, උපලේඛණයේ 2 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛණයේ 2 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින් මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් පරිදි විස්තර, එනම්—

(අ) විකුණූ දිනය ;
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුනූ ප්‍රමාණය (බර අනුව) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන් ද යන වග ;
(ඉ) විකුණූ ද්‍රව්‍ය පිළිබඳ විස්තරය, අතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බව නියම කරමි.

(8) උපලේඛණයන්හි 2 වෙනි තීරයේ සඳහන් යට ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණන ලබන ද්‍රව්‍ය ධනා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත්, උපලේඛණයන්හි 3 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

(9) ඕලන්දයෙන් ලැලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහයක් අඩුකොට ඉතිරිබර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

(10) චීනයෙන් ලැලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහතුනක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(11) ජපානයෙන් ලැලි පෙට්ටිවල ගෙන්වන ලද ආර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් රාත්තල් විසිපහක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බව ද,

9443—ජෙ. ඇන්. ආර් 26923—4,077 (11/58)

(12) ලැලි පෙට්ටිවල හැර වෙනයම් කිසිවක බහා අර්තාපල් විකුණන විට අර්තාපල් බහා ඇති එම එක එක ගාණ්ඩය සඳහා රාත්තල් තුන බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(13) මෙම නියෝගය සඳහා '' ශුද්ධ '' යන්නෙන් හැඟවෙන්නේ දළ බරින් තාර බර අඩුකොට ඉතිරි වන බර හෝ අර්තාපල්වල පමණක් බර බව ද, නියම කරමි.

1958 නොවැම්බර් මස 17 වෙනි දින පෙරවරු 11. ට නුවරඑළියේ කච්චේරියේදී අත්සන් තබන ලදි.

ඒ. සී. බනෝලමියුස්,
සහකාර මිළ පාලක (ආහාර), නුවරඑළිය.

## උපලේඛණය '' ඒ ''

### ශුද්ධ බර හොණ්ඩරයක වැඩිම තොග වෙළඳ මිළ

| 1 තීරය<br>ප්‍රදේශය | 2 තීරය<br>විස්තරය | 3 තීරය<br>ශුද්ධ බර හොන්ඩරයකට තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළ<br>රු. ශ. |
|---|---|---|
| (1) නුවරඑළියේ නාගරික සහා ප්‍රදේශය | | |
| (2) කඳපොල | | |
| (3) නානුඔය | | |
| (4) රම්බොඩ ටවුම | | |
| (5) සංගිලිපාලම | | |
| (6) කුඩාඔය | | |
| (7) පුන්ඩළුඔය | අර්තාපල් | 30 42 |
| (8) තිස්පනෝ කෝරලේ | | |
| (9) පල්ලෙපනෝ කෝරලේ | | |
| (10) මොරපෙ | | |
| (11) විලිකුල්විටි | | |
| (12) ඩයගම් | | |
| (13) ආගරපතන | | |
| (14) මැදපනෝ ගවිකායයි සහා ප්‍රදේශය | | |
| (15) රාගල | අර්තාපල් | 30 55 |
| (16) උඩපුස්සැල්ලාව | | |
| (17) නිල්දණ්ඩාහින්න | | |
| (18) හරස්බැද්ද | | |
| (19) වතුමුල්ල | අර්තාපල් | 30 99 |
| (20) කුඹල් ගමුව | | |
| (21) දිඹුල | | |
| (22) වටගොඩ | | |
| (23) තලවකැලේ | අර්තාපල් | 30 6 |
| (24) ලිඳුල | | |
| (25) වලහ | | |
| (26) කොටගල | | |

## උපලේඛණය '' බී ''

### ශුද්ධ බර රාත්තලක වැඩිම සිල්ලර මිළ

| 1 තීරය<br>ප්‍රදේශය | 2 තීරය<br>විස්තරය | 3 තීරය<br>ශුද්ධ බර රාත්තලකට සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළ<br>රු. ශත |
|---|---|---|
| (1) නුවරඑළිය නාගරික සභා ප්‍රදේශය | | |
| (2) නානුඔය | | |
| (3) කඳපොල | | |
| (4) රාගල | | |
| (5) උඩපුස්සැල්ලාව | | |
| (6) රම්බොඩ ටවුම | | |
| (7) සංගිලිපාලම | | |
| (8) කුඩාඔය | | |
| (9) පුන්ඩළුඔය | | |
| (10) තිස්පනෝ කෝරලේ | | |
| (11) පල්ලෙපනෝ කෝරලේ | | |
| (12) මොරහේ | අර්තාපල් | 0 33 |
| (13) විලිකුල්විටි | | |
| (14) ඩයගම | | |
| (15) ආගරපතන | | |
| (16) මැදපනෝ ගම්කායයී සභා ප්‍රදේශය | | |
| (17) දිඹුල | | |
| (18) වටගොඩ | | |
| (19) තලවාකැලේ | | |
| (20) ලිඳුල | | |
| (21) වලහ | | |
| (22) කොටගල | | |
| (23) අබේවෙල | | |
| (24) නිල්දණ්ඩාහින්න | | |
| (25) හරස්බැද්ද | අර්තාපල් | 0 34 |
| (26) වතුමුල්ල | | |
| (27) කුඹල්ගමුව | | |
| (28) රූපහ | අර්තාපල් | 0 35 |

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.